5.2 ඇල්ගොරිතම හඳුනා ගනිමු

යම් ගැටළුවක් විසඳීම සඳහා අනුගමනය කල යුතු පියවර සියල්ල අනුපිළිවෙලින් දැක්වීමේ ක්‍රමවේදය ඇල්ගොරිතමයක් ලෙස අපි දනිමු.

ඇල්ගොරිතමයක් ලිවීමේදී සැලකිය යුතු කරුණු-

- ඇල්ගොරිතම ලිවීමේදී පියවරයන් අනුපිළිවෙලින් ලිවිය යුතුය.
- ඇල්ගොරිතම ලිවීමේදී ආරම්භයක් සහ අවසානයක් තිබිය යුතුය.
  - ✓ අපි සරල උදාහරණයක් බලමු.

ලිපියක් ලියා තැපැල් කිරීම ට අදාල ඇල්ගොරිතමය

- පියවර 1 ආරම්භය
- පියවර 2 කඩදාසියක් සහ පෑනක් ගැනීම.
- පියවර 3 ලිපිය ලිවීම.
- පියවර 4 ලිපිය නැවීම.
- පියවර 5 ලිපිය ලිවුමි කවරයට දැමීම.
- පියවර 6 ලිවුම් කවරයේ ලිපිනය ලිවීම.
- පියවර 7 ලිවුම් කවරය ඇලවීම.
- පියවර 8 මුද්දරය ඇලවීම
- පියවර 9 තැපැල් පෙට්ටියට දැමීම
- පියවර10 අවසානය

ක්‍රියාකාරකම- 1

පලතුරු බීමක් සාදා පිළිගැන්වීමට අදාල ඇල්ගොරිතමය නිවැරදිව පෙල ගස්වන්න

ආරම්භය	අවසානය
පලතුරු ගන්න	බ්ලෙන්ඩරයට දමන්න
සීනි සහ ලුනු ස්වල්පයක් එක් කරන්න	භාජන වලට දමන්න
බ්ලෙන්ඩර් කරන්න	අයිස් කැට එකතු කරන්න
පොතු ඉවත්කර කැබලි කපාගන්න	පිළිගන්වන්න
සෝදාගන්න	